# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,250—1964 දෙසැම්බර් 5 වැනි සෙනසුරාදා—1964.12.5**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

### සුළු නගර සභා ආඥාපනත
### 2, 5, 6 සහ 9 වැනි වගන්ති යටතේ වූ ආඥාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 2, 5, 6, සහ 9 වැනි වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 දෙසැම්බර් 3 දින,
කොළඹ දී ය.

#### ආඥාව

මුල්ලේරියාව සුළු නගර සභාව සංස්ථාපනය කිරීමට අදාලව, 1964 සැප්තැම්බර් 11 වැනි දින අංක 14,166 දරන ගැසට් පත්‍රයේ පළ කරනලද ආඥාව පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඊට යා කොට ඇති පළමුවැනි උපලේඛනයේ, "මුල්ලේරියාව නගරයේ සීමා" යන ශීර්ෂය යටතේ, "අංක 504 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ බෙලගම සහ කැළණිමුල්ල" යන වචන වෙනුවට, "අංක 504 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ බෙලගම (කොටස) සහ කැළණිමුල්ල (කොටස), අංක 505 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ අංගොඩ (කොටස)" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(2) ඊට යා කොට ඇති දෙවැනි උපලේඛනයේ "මුල්ලේරියාව නගරයේ ඡන්ද කොට්ඨාශ සීමා" යන ශීර්ෂය යටතේ—

(අ) "අංක 3 දරන ඡන්ද කොට්ඨාශය—අඹතලේ" යන ශීර්ෂය යටතේ එහි නැගෙනහිර සීමාවේ විස්තරයෙහි වූ "කුඩලුවාගාර ගම් සහා පාරේ මධ්‍ය රේඛාව" යන වචන වෙනුවට, "ගිණිකොන දෙසට දීර්ඝ කළ මාලිගාගොඩැල්ල පාරේ මධ්‍යම රේඛාව" යන වචන ආදේශ කිරීමෙන් ද,

(ආ) "අංක 3 දරන ඡන්ද කොට්ඨාශය අඹතලේ" යන ශීර්ෂය යටතේ එහි දකුණු සීමාවේ විස්තරයෙහිවූ "කුඩලුවාගාර ගම් සහා පාරේ මධ්‍ය රේඛාව" යන වචන වෙනුවට, දීර්ඝ කළ මාලිගාගොඩැල්ල පාරේ මධ්‍ය රේඛව ඔස්සේ සහ එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට" යන වචන ආදේශ කිරීමෙන් ද,

(ඇ) "අංක 4 දරන ඡන්ද කොට්ඨාශය මුල්ලේරියාව දකුණ" යන ශීර්ෂය යටතේ "නැගෙනහිරට: අවසන්වරට සඳහන් කළ ලක්ෂයේ සිට" යන වචන වල සිට "උතුරු දෙසට ඇඳි රේඛාවකින් ද වේ" යන වචන දක්වා පහත සඳහන් වචන ආදේශ කිරීමෙන් :—

නැගෙනහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට මුල්ලේරියාව-තලංගම රජයේ වැඩ දෙපාර්තමේන්තු පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ, එය, අංගොඩ-මුල්ලේරියාව රෝහල පාර සමග සන්ධි වන ස්ථානයේ මැද දක්වා ගිනිකොණ දෙසට සහ නිරිත දෙසට ඇඳි රේඛාවකින් ද,

දකුණට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට, අංගොඩ-මුල්ලේරියාව රෝහල පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ, එය, කැළණිමුල්ල-කොස්වත්ත පාර සමග සන්ධි වන ස්ථානයේ මැද දක්වා බස්නාහිර දෙසට ඇඳි රේඛාවකින් ද,

බස්නාහිරට : අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට, කැළණිමුල්ල-කොස්වත්ත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍ය දක්වා උතුරු දෙසට අඳින ලද රේඛාවකින් ද වේ.

(ඈ) "අංක 5 දරන ඡන්ද කොට්ඨාශය අංගොඩ" යන ශීර්ෂය යටතේ එහි නැගෙනහිර සීමාවේ විස්තරයෙහිවූ "එතැන් සිට අංගොඩ නැගෙනහිර සීමාව ඔස්සේ දකුණු දෙසට සහ ගිණිකොන දෙසටද" යන වචන වෙනුවට, "එතැන් සිට කැළණිමුල්ල-කොස්වත්ත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ" යන වචන ආදේශ කිරීමෙන් ද,

(ඉ) "අංක 6 දරන ඡන්ද කොට්ඨාශය හිඹුටාන" යන ශීර්ෂය යටතේ එහි උතුරු සීමාවේ විස්තරයෙහි වූ "හිඹුටාන ගම් සහා පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය, මුල්ලේරියාව-තලංගම රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර සමග සන්ධි වන ස්ථානයේ මැද දක්වා" යන වචන වෙනුවට "එකී සීමාව ඔස්සේ එහි නැගෙනහිර අන්තය දක්වා" යන වචන ආදේශ කිරීමෙන් ද,

(ඊ) "අංක 6 දරන ඡන්ද කොට්ඨාශය හිඹුටාන" යන ශීර්ෂය යටතේ, එහි දකුණු සහ බස්නාහිර සීමා විස්තරයෙහි වූ "එතැන් සිට වයඹ දෙසට සහ උතුරු දෙසටද" යන වචන වෙනුවට, "එතැන් සිට උතුරු දෙසට" යන වචන ආදේශ කිරීමෙන් ද, හා

(උ) "අංක 7 දරන ඡන්ද කොට්ඨාශය—උඩුමුල්ල" යන ශීර්ෂය යටතේ, එහි උතුරු සීමාවේ විස්තරයෙහි වූ "අංක 4 දරන ඡන්ද කොට්ඨාශයේ දකුණු සීමාව" යන වචන වෙනුවට, "අංක 4 දරන ඡන්ද කොට්ඨාශයේ නැගෙනහිර සීමාව" යන වචන ආදේශ කිරීමෙන්,

12-414/1

## සුළු නගර සභා ආඥාපනත

### 2, 5, 6 සහ 9 වැනි වගන්ති යටතේ වූ ආඥාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 2, 5, 6 සහ 9 වැනි වගන්තිවලින් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඒ. පී. ජයසූරිය,
පළාත් පාලනය සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති.

1964 දෙසැම්බර් මස 3 වැනි දින,
කොළඹ දීය.

### ආඥාව

1964 සැප්තැම්බර් 11 වැනි දින අංක 14,166 දරන ගැසට් පත්‍රයේ පළවූ ද, කොටිකාවත්ත සුළු නගර සභාව සංස්ථාපනය කිරීමට අදාළ වූ ද ආඥාව පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඊට යා කොට ඇති පළමුවැනි උපලේඛනයේ "කොටිකාවත්ත නගරයේ සීමා" යන ශීර්ෂය යටතේ වූ, ප්‍රදේශයේ විස්තර යෙහි සඳහන් "අංක 505 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ" සිට "අංක 507 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ බ්‍රැන්ඩිය වත්ත සහ වෙන්නවත්ත" යන සියලුම වචන වෙනුවට, "අංක 504 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ බෙලගම (කොටස) සහ කැළණිමුල්ලේ (කොටස), අංක 505 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ කොටිකාවත්ත සහ අංගොඩ (කොටස), අංක 506 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ කොහිලවත්ත, කුඩා බුත්ගමුව සහ මහ බුත්ගමුව, අංක 507 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ බ්‍රැන්ඩියවත්ත සහ වෙන්නවත්ත, අංක 508 දරන ග්‍රාම සේවක කොට්ඨාශයේ කිත්තන්පහුව" යන වචන ආදේශ කිරීමෙන් ද,

(2) ඊට යා කොට ඇති දෙවැනි උපලේඛනයේ, "කොටිකාවත්ත නගරයේ ඡන්ද කොට්ඨාශ සීමා" යන ශීර්ෂය යටතේ,

(අ) එහි "අංක 1 දරන ඡන්ද කොට්ඨාශය—කොටුවිල" යන ශීර්ෂය යටතේ, එහි නැගෙනහිර සහ දකුණු සීමාවල විස්තරයන් හි වූ "වෙන්නවත්ත-කොටුවිල ගම් සහ පාර" යන වචන වෙනුවට "ගෝතමී පාර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි "අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—වෙන්නවත්ත" යන ශීර්ෂය යටතේ, එහි දකුණු සීමාවේ විස්තරයෙහි වූ "බ්‍රැන්ඩියවත්ත ගම් සහ පාර" යන වචන වෙනුවට "වෙන්නවත්ත ගම්සහ පාර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි, "අංක 2 දරන ඡන්ද කොට්ඨාශය වෙන්නවත්ත" යන ශීර්ෂය යටතේ, එහි බස්නාහිර සීමාවේ විස්තරය වෙනුවට පහත දැක්වෙන විස්තරය ආදේශ කිරීමෙන් ද වේ. එනම් :—

"**බස්නාහිරට :** අවසන් වරට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වෙන්නවත්ත ගම් සහ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ එය, වැල්ලම්පිටිය-කොටුවිල රජයේ වැඩ දෙපාර්තමේන්තු පාරට වැටෙන දෙවට පටුමග සමග සන්ධි වන ස්ථානයේ මධ්‍යම ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට ද, එතැන් සිට එකී දෙවට පටු මගේ මධ්‍ය රේඛාව ඔස්සේ, එය වැල්ලම්පිටිය-කොටුවිල රජයේ වැඩ දෙපාර්තමේන්තු පාර සමග සන්ධි වන ස්ථානයේ මධ්‍යම ලක්ෂ්‍යය දක්වා බස්නාහිර දෙසට ද, එතැන් සිට එකී පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ, එය, අංක 1 දරන ඡන්ද කොට්ඨාශයේ නැගෙනහිර සීමාවේ දකුණු අන්තය හමුවන තෙක් උතුරු දෙසට ද, එතැන් සිට එකී නැගෙනහිර සීමාව ඔස්සේ ඡන්ද කොට්ඨාශයේ උතුරු සීමාවේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා උතුරු දෙසට, නැගෙනහිර දෙසට සහ වයඹ දෙසට අඳින ලද රේඛාවකින් ද වේ.

12-414/2

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි